## ප්‍රවේසම්වන්න




මේ ලෝකෙ මේ නීති රීති සීමා මායිම් වගේ දේවල් ගොඩ නගාගෙන තියෙන්නෙ අපව හික්මවන්නනෙ. අපි කොච්චර කැමති වුණත් නැතත් අද අපට මේවට අවනත වෙන්න වෙලා තියෙනවා. සාමාන්‍යයෙන් පවතින නීති බොහොමයක් සමාජය පාලනය කරන්න උපකාර වුණත් සමහර නීති ටිකක් අවුල් වෙන වෙලාවලුත් තියෙනවා. ඒකනෙ ඒ නීති වලට එරෙහිව සමහරු නැගීසිටින්නෙ. ඇත්තම කිව්වොත් හුගක් නීති නිසා සමාජයට අවැඩකට වඩා වෙලා තියෙන්නෙ හොඳක්. නැත්නම් ඉතින් ගහ උඩ හිටපු සතා බිමට බැහැල ඇවිදලා පිළිවෙලකට හැඩ වැඩ වෙලා ගොනු වෙලා අද ඉන්න තත්වයට පත්වුනත් කොයි වෙලාවෙ හරි ඉඩක් ලැබුණ ගමන් යට ගිය සතා එළියට පනින්න හදනවනෙ. නීතියෙන්ම තමයි ඌ පාලනය වෙලා ඉන්නෙ.

අවංකවම කියනවා නම් මෙහෙට ආවට පස්සෙ තමයි සමාජයක් හරියටම නීති රීති පිළිපදිනවා දැක්කෙ. උදාහරණයට වාහන පැදවීමම ගන්න. ඉඳල හිටල එකෙක් දෙන්නෙක් පීලි පැන්නත් සමස්ථයක් ඒ නීති වලට එකඟනෙ. ඒකනෙ සාමාන්‍යයෙන් හැමදේටම බය කාන්තා පක්ෂයත් බය නැතිව වාහනයක් එළවගෙන පාරක තොටක යන්නෙ.

වාහනයට නැගල සීට් බෙල්ට් එක දාන තැන ඉඳලා ගමනාන්තය දක්වා නීති රීති නම් කීයක්ද? අපි ඒ නීති වලට අනුගත වෙන්නෙ දඩ කොළේට තියෙන බය නිසාම නෙවෙයි. ඒ නිසා අපට ලැබෙන ආරක්ෂාව ගැනත් හිතලනෙ. මේ රථ වාහන නීති නිසා මට නම් මල පැන්න අවස්ථා අනන්තයි. අතුරු පාරක 40-50 ට යන එකයි අසූවෙ සෝන් එකේ හැටට යන එකයි මට නම් මරනවා වගෙයි. ඒත් මොනවා කරන්නද? බහුතර මතයට එකඟ වෙන් එපායැ. "ස්පීඩ් කිල්ස්" කියලනෙ ස්ලෝගන් එක තියෙන්නෙ.

ඇත්තටම මට මේ නීති රීතියි රථවාහනයි සේරම මතක් වුණේ ගිය සතියෙ තිබුණ මළ ගෙදර නිසා. රථවාහන අනතුරක් නිසා අපේ සමාජයේ සිදුවුණ විශාලම බෙදවාචකය තමයි ඒක. හරිම කණගාටුදායකයි. ඕස්ට්‍රේලියාවෙ මම දැක්ක පළමුවෙනි මළ ගෙදර දෙමාපියන් එකට අවසන් ගමන් ගිය. ලංකාවෙදි නම් දැකල තියෙනවා.



ප්‍රියයන්ගෙන් වෙන්වීම කොතරම් දුකක්ද? මේ මළ ගෙදරත් අවාසනාවන්ත ක්‍රියාවක ප්‍රතිඵලයක්. කාල මරණ වලට කෙසේ වෙතත් අකාල මරණ වලට මිනිස්සු මේ වගේ රටවලදි මේ විදිහට ගොදුරු වීම නම් හරිම බෙදවාචකයක්.

හැමෝටම කියන්නෙ ප්‍රවේසමෙන් වාහන පදවන්න කියලයි.

## සාධාරණය කොතැනද?



ඊශ්‍රායල්කාරයො එකසිය ගාණට හිටු කියලා රොකට් වෙඩි හමාස් එක පැත්තට ජෙරුසලමෙ ඉඳන් ගහනවා. ඒකට රිටන් එක ගාසා එක පැත්තෙ ඉඳල එන්නෙ අවුරුද්දට කිඹුලපිටියෙ හදපු නිලා පත්තු කරනවා වගේ. මිනිස්සු මැරුණ ගාණ දහසත් ඉක්මවලා. ගෙවල් දොරවල් නගර විනාස වෙන දිහා ලෝකයා මාධ්‍ය හරහා බලා ඉන්නෙ අඃ අඃ ගගා කට ඇරගෙන. එක අතකට ලෝකයා වෙන මොනවා කරන්නද? වැඩේ ඇවිලුණේ හමාස් එකේ කට්ටිය ඊශ්‍රායල් කොල්ලෙක් උස්සලා මරුව නිසා කියලයි මාධ්‍ය කියන්නෙ. ඒ කතාව ඇත්ත වුණත් අපි එකඟ වුණත් නැතත් හමාස් එකට දිනාගන්න අරමුණක් තියෙනවා. උන් සටන් කරන්නෙ තමන්ට අහිමි වී ගිය දේ ලබා ගන්න. ඊශ්‍රායලය සටන් කර්නෙ උදුරගත්ත දේ රැක ගන්න.

මේ අසාධාරණ අසමාන සටන යන අතරේ වැදගත්ම දේ නම් මහා පට්ට දවාලේ සිදුවන මේ සාපරාධී ක්‍රියා නවත්තන්නට නොහැකිව එක්සත් ජාතීන්ගේ සංවිධානයත් නන්නත්තාර වෙලා ඉඳීමයි. බංකි මූන්ට බංකුවක් උඩටම වෙලා ඉන්න වෙන සයිස් එකක් තියෙන්නෙ.

ඊශ්‍රායල් කාරයෝ ඊයෙ ගාසා වල යූඑන් එකෙන් පාලනය වන සරණාගත කඳවුරටත් ගහලා. ඒකටත් සද්දයක් නෑ. මට නම් සිහිවෙන්නෙ වැටෙයි නියරෙයි කතාව.

හිතෙන්නැද්ද කට්ටියට ලෝක බල තුලනයක අවශ්‍යතාව කොයි තරම් වැදගත්ද කියලා මේ වගේ වෙලාවක. හැමෝටම අමාරුව තිබුණෙ කොමියුනිස්ට් වාදයයි සමාජවාදයයිනෙ. කට්ටියම සෙට් වෙලා ඒක නැති කරලා දැම්මා. දැන් හැමෝටම සනීපයිනෙ. අම්බානක වැරදි අඩුපාඩු තිබුණත් සොවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර තිබුණා නම් ලෝකයේ දැන් සිදුවෙන හුගක් කෙලි සෙල්ලම් මේ විදිහට වෙන එකක් නෑ කියලයි මට නම් හිතුනෙ.

මේ කියන්නෙ පුටින්ට සපෝට් කරමු කියලා නෙවෙයි. මේ ප්‍රශ්නෙදි මිය යන පලස්තීන මිනිස්සු දිහා බලලා තමන්ට හැකි පමණින් ඊට විරෝධයක් පාන එක හැමෝගෙම යුතුකමක් නේද? ඒක නිසයි බැරි බැරි ගාතෙ හරි අසාධා රණයට විරුද්ධ මිනිස්සු යුද විරෝධී පෙළපාලි පවත්වන්නෙ. ඒක හමාස් එකට කරන සපෝට් එකක් නෙවෙයි. ඒක මේ අපරාධ වලට එරෙහිව මනුෂ්‍යත්වය රැකගන්න කරන ව්‍යායාමයකත් විතකරයි.

බොලේ දැන් තමයි මතක් වුණේ. අපේ ජනාධිපති තුමා පලස්තීන සහයෝගිතා කමිටුවේ යාවජීව සභාපති නේද? යුතුකමක් ඉටු කරන්න එයාට බැරි නම් අඩු තරමේ විමලෙ හරහා හරි පොඩි වැඩක් ඕගනයිස් කරන්න තිබ්බා නේද? මල්ලි හම්බයින්ට ගැහුව එකේ මේ වගේ දේකින් හරි අයියට ඒ වැරැද්ද හරිගස්සගන්න තිබුණා නේද?

## රටවැසියා වෙනුවෙන් යුතුකම් කරන රටක්



මම අවංකවම ලේබර් එකට කැමතියි. මෙහෙ දේශපාලනය ගැන මට ලොකු උනන්දුවක් නැහැ. ඒත් මම මේ ධනපති දේශපාලනයට නෙවෙයි මේ දේශපාලන රටාවට ශික්ෂණයට අවංක කමට කැමතියි. ඒ වගේම මෙහි ඇති වටිනාකම් වලටත් ගරු කරනවා.

ටෝනි ඇබට් හා ජුලියා බිෂොප් මේ දවස් වල මැලේෂියානු ගුවන් යානයේ ගිහින් මිය ගිය ඕස්ට්‍රේලියානුවන් වෙනුවෙන් කරන සටන ගැන මගේ තියෙන්නෙ ගෞරවයක්. ඒක ටෝනි ඇබට් ගේම නෙවි ඕස්ට්‍රේලියානු ආණ්ඩුවේ ප්‍රතිපත්ති බව ඇත්ත . ඒත් මේ වෙලාවෙ බලයෙ ඉන්නෙ ඔහුනෙ. ඒ නිසා ඔහුගෙ ක්‍රියාව මගේ අගය කිරීමට ලක්වෙනවා.

මෙතන තියෙන වැදගත්ම දේ තමන්ගෙ රටේ මිනිස්සු මිය ගියා වුවත් ඔවුන්ගෙ අයිතිය වෙනුවෙන් රජය පෙනී සිටින ආකාරයයි. මුලු යානාවේම සිටි දෙසිය අනූ ගණනින් ඔස්ට්‍රේලියානුවන් හිටියෙ විසි ගණනයි. ඒත් ඒ මළ සිරුරු ලබා ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛයා බවට පත්ව ඉන්නෙ ඕස්ට්‍රේලියාවයි.

තමන්ගෙ රටට විදේශ විනිමය හොයන ප්‍රධාන කරතව්‍යය ඉටු කරන දහස් ගණන් කාන්තාවන් අනත්තතව දූෂණයට හිංසාවට ලක්ව මිය යාමට පවා ඉඩ දී ඒ වෙනුවෙන් කිසිම සාධණීය පියවරක් නොගන්නා ආණ්ඩුවක් ඇති රටක හිටිය අපට මෙය නම් අපූරු අත්දැකීමක්. තමන්ගෙ පුරවැසියා කුමන ආකාරයේ ක්‍රියාවකට පම්බන්ධ වූවත් ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටීමට කුමන තත්වයක් යටතේ වුවත් මේ රජය බැඳී සිටින ආකාරය සැසසුම් කටයුතුයි. (හැබැයි ඉතින් දැන් කෙනෙකුට තර්ක කරන්න පුලුවන් " යකෝ මුන් මේ විස්සක් වෙනුටෙවන මැරෙන්න හදනවා. මෙච්චර බලවත් ශක්තිමත් රටක් වෙලත් ඇමරිකන් කාරයගේ අංක එකේ සගයෙක් වෙලත් අර ගාසා තීරයේ දහස් ගණනින් මියයන ගෑනුන්ගෙ ළමයින්ගෙ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් යමක් කරන්න උත්සාහයක් වත් ගන්නෙ නැත්තෙ ඇයි කියලා) චූටි මල්ලිත් ඉන්නෙ ඒකම හිත හිතා තමයි . ඒත් ඉතින් ඉස්සෙල්ලම හොඳ වැඩේට හොඳයි කියලා ඉන්න එපායැ.

**චූටි මල්ලි**

---







ඉංගිරිසියේ 'හන්ඩ්‍රඩ් වේට්' (Hundred Weight) සිය බසට පැමින ඇත්තේ 'හොන්ඩර' යනුවෙනි. එක් වර ම එහි නෑකම නොපෙනුනත් සැලකිල්ලෙන් සිතා බැලූ විට හොන්ඩරය පැමින ඇත්තේ, ඉංගිරිසියේ 'හන්ඩ්‍රඩ් වේට්' යන්නෙන් බව අවබෝද වේ. ඇමරිකාවේ එය රාත්තල් 100 ක් වුවද මහා බ්‍රිතාන්‍යයේ දී එය රාත්තල් 112 කි. එය රාත්තල් 100 කිරීමේ තේරුමක් ඇති බව පෙනෙතත් ගතානුගතික වූ මහා බ්‍රිතාන්‍යය එය වෙනස් කලේ නැත. Check, Center, Meter වැනි වචන ඇමරිකාවට හොඳ වුවත්, Cheque, Centre, Metre ම මහා බ්‍රිතාන්‍යය රැක ගෙන ඇත්තේ අපේ මුත්තා මැරෙන තෙක් කොන්ඩය බැන්ද විදියට ම ය.

'කාර්තුව' ද ඉංගිරිසියේ 'ක්වෝටර්' (Quarter) යන වචනයෙන් බිඳ ගත් සිංහල වචනයයි. දෙමලෙන් ගත් කාල (ක්) තියෙද්දී කාර්තුව (ක්) ගත්තේ ඇයි ? පහනක් තියෙද්දි ලාම්පුවක් ගත් හේතුව ම මෙයට ද හේතු වී ඇති බව පෙනේ. පොල් තෙල් පහනත්, බීම් තෙල් ලාම්පුවත් ගැන සිතා බලන්න. හොන්ඩර කාර්තුව, අක්කර කාර්තුව අපට හුරු නැත.

ඉංගිරිසියේ 'එක (ර්)' පලමුවෙන් දෙමලටගිය බව පෙනේ. අක්කරෙ යන්න අක්කර වී සිය බසට පැමින ඇත. එය කෙලින් ම ඉංගිරිසියෙන් ගත්තා නම් ඒකර, ඒකරු, එක්කර වැනි වචනයක් හැදෙන්නට ඉඩ තිබිනි. අක්කරෙ පත්තු - මුනක්කරෙ (මුනු - අක්කරෙ) යන දෙමල නම් ගැන හිතන්න.

මුදිකඑල අපට 'මිදි' වුවත් දෙමලට එය 'මුද්දිර පලම්' විය. කොළඹ පදික වේදිකාවේ දමිල වෙලෙන්දන් මිදි විකුනුවේ 'මුද්දිරප්පලම් - මුද්දිරප්පලම්' කියා ය්. එය ඇසුනු අපේ අයට මිදි අමතක විය. ඔවින් ද එය 'මුද්‍රස්පලම්' යනුවෙන් ගත් බව පෙනේ.

'මෝල' ද හොඳ වචනයකි. වී මෝල, ලීමෝල, ගල් මෝල, තෙල් මෝල අපට නිතර ඇසෙන පදයකි. යතුරකින් - මැසිමකින් එහි වැඩ කෙරෙන නිසා එය මෝලක් වී ඇත. වී කෙටීම, ලී ඉරීම, ගල් කැඩීම, තෙල් හිඳීම අපට අමුතු වැඩ නොවේ. හැබැය් අප ඒවා කෙලේ මැසිමකින් නො වේ.

වනේ ලා හෝ හමේ ලා අපි වී කෙටුවෙමු. වනේ ලා පොල්, (හිඳීම සඳහා), පිටි කෙටුවෙමු. එය කෙටුවේ 'මෝලෙනි'. 'මිල් ' යන්නට 'මෝල් ' ගත් කෙනාට අපේ මෝල සිහි වී ඇති බව පෙනේ. වචනයක් හදන්නේ / හැදෙන්නේ රැස්වීමක් පවත්වා සම්මත කර ගැනීමෙන් නො වේ ; එකකු කියූ දෙයක් තව එකකු කීම හෝ එකකු ලියූ දෙයක් තව එකකු ලිවීම නිසා ය.

මීටරය එන්නට පෙර අප රෙදි මැන්නේ යාර වලිනි. ඉංගිරිසියේ යාඩ් (Yard) බහ්වර්ත පදයකි. ගේකට යාබද ව හෝ ගෙයක් වටා ඇති බිමත්, දුම්රිය පාරේ ඉස්ටේසමට යාබද ඉඩමත්, අඟල් 36 ක දිගත් (තවත් තේරුම් ඇත) යාඩ් (Yard) එකකි. ඒ යාඩ් (Yard) සිය බසට බිඳී ආවේ 'යාර' කියාය්. එහෙත් අපේ 'යාරය' අඟල් 36 ක දිග මිස වෙනත් තේරුමක් ඇතිව වියහර නොවේ.

අලුත් වචනයක් දුටුවිට - ඇසුනු විට සමහරු 'කුලප්පු' වෙති. ලංකාවේ වාහනවලට "ශ්‍රී" අකුර යෙදීමට එරෙහි වූවන් එදා කීවේ නොම්මර තහඩුවේ මඩ - ගොහොදු - ජරාව නෑවෙන - ගෑවෙන හෙය්න් "ශ්‍රී" අකුරේ ඇති (ශුද්ද වූ) තේජස එය්න් නැති වන බවය්. එය ආවේ පන්සලෙනි.



එසේ ම ප්‍රින්ටිං ප්‍රෙස් (Printing Press) යන්නට මුනිදාස පඬි තුමා දුන් 'පහරුව - පහරන' යන වචන නොරිසි වූවන්ට මල - මල පහ කිරීම - පැහැරීම සිහි වී එයට ද තප්පු ලෑ හැටි මෙහි දී මතක් වෙය්. ඉංගිරිසි දික්නරියේ 'ප්‍රෙස් ' (Press) යන්න තේරුම් කර ඇති විදය අනුව (Press) ප්‍රෙස් යන්නට දිය හැකි හොඳ ම වචනය 'පහරුව - පහරනවා - පැහැරුවා' ය. එසේ තප්පු ලෑවුන් විසින් කල යුතුව තිබුනේ - මුද්‍රනාලය මුද්‍රනය කරනවා යන ගොරහැඩි, කතා බහට ගත නොහැකි වචන වෙනුවට අලුත් වචනයක් නිර්මානය කිරීමය්. එය තත්සම වචනයක් හෝ නිශ්පන්න වචනයක් විය හැකිය.

"විජය මුද්‍රනාලයයේ මුද්‍රනය කරන ලදී හා විජය පහරුවේ පැහැරුවිනි." යන වැකකි දෙකේ වෙනස ගැන සිතා බලන්න.

අපේ බස ලොවේ ඉහල තැනක වැජඹෙන බසක් යැය් කියනවාට වඩා (මගේ එක හොඳ ම එක) එයට අලුත් වචන හදා ගන්නා ක්‍රමයක් ගැන හෝ අලුත් වචන ඇද ගන්නා ක්‍රමයක් ගැන සිතීම හොඳ නේ ද ?

කාල පරාසය, (සෙල) සය්ල බිත්තිය හොඳ නිර්මාන බව පෙනේ. මීටර්, ලීටර්, ග්‍රෑම්, ඩ්‍රෑම් (ග්‍රෑම්, ඩ්‍රෑම් කියවිය යුත්තේ 'ධ්‍රැවය මෙන්, ග්‍රෑම් ඩ්‍රෑම් කියාය්) ඒ විදියට ම ගන්නවා ද , නො එසේ නම් අලුත් වචන හදා ගන්නවාද යන්න උගතුන්ගේ ඔලුවල පහල විය යුතු අදහසකි.

හෙමින් යනවා, හෙමින් දොඩනවා යන්නේ හෙමින් යන වචනයේ තේරුම් දෙකකි. ඉංගිරිසියේ (Slowly Softly) ස්ලෝ ලි - සොෆ්ට් ලි යනුවෙන් ඒ සඳහා වචන දෙකකි. (මෙහි භාගය, භෝග, සෝර, ඝෝෂාව වැනි වචන ලියා ඇත්තේ බාගය, බෝග, ගෝර, ගෝශාව මෙන් අල්ප ප්‍රාන අකුරු ඉදිරියේ කොමාවක් යෙදීමෙනි. යතුරු පුවරුවේ ද එය ඇති හෙය්න් ගැටලුවක් ඇති නොවේ. මෙය අත් හදා බැලීමකි. ණ, ළ, ෂ අකුරු වෙනුවට දන්තජ, තාලුජ අකුරු මා ලියන බව ඔබ දනිති.